පාලින්දනුවර ප්‍රාදේශීය සභාව
කළුතර දිස්ත්‍රික්කය
---------------------------------

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 05 දින සභාපතිවරයාට යවා ඇත.

1:2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර , මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **<u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>**

1.3.1 **<u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2008 වසරේදී ආපදා කළමණාකරණ මධ්‍යස්ථානයෙන් පරිත්‍යාග ලෙස ලැබී තිබූ බෝට්ටු එන්ජින් හතරක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 වසරේ සිට 2017 වසර දක්වා භාණ්ඩ සමීක්ෂණයන් තුලින් හඳුනාගෙන වෙන්දේසි කළ, විනාශ කළ හා ඉවත් කළ අයිතම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාව සතුව පවතින GI බට 178 ක් හා 20× 20 ටෙන්ට් එකක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.2 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුව අගලවත්ත ප්‍රාදේශීය සභාවෙන් ලැබිය යුතු ලෙස රු.5,931,815 ක් දක්වා තිබූ අතර අගලවත්ත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුව පාලින්දනුවර ප්‍රාදේශීය සභාවෙන් ලැබිය යුතු රු.5,342,424 ක් හා පාලින්දනුවරට ගෙවිය යුතු රු.7,782,632 ක් දක්වා තිබුණි. මෙම ගනුදෙනු නිරාකරණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

1:3:3 **<u>විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම</u>**

යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, ඉන්වෙන්ට්‍රි ලේඛනය, භාණ්ඩ සමීක්ෂණ වාර්තා හා අයිතිය දැක්වෙන ලේඛන , ඔප්පු හා පැවරුම් නියෝග නොමැතිවීම නිසා එකතුව රු.71,362,164 ක් වූ ගිණුම් විෂයයන් 06 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය / සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.4 <u>නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්</u>

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ | | |
| (i) 134(1) වගන්තිය | --- | දියුණුකළ ප්‍රදේශ වශයෙන් ප්‍රාදේශීය සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශ ඇතුළත පිහිටියා වූ යම් නිශ්චල දේපළක් හෝ නිශ්චල දේපළ සම්බන්ධයෙන් වාර්ෂික වටිනාකම මත වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) 143 (1) වගන්තිය | --- | අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව සභාව විසින් වරිපනම් බදු සඳහා නව හඳුනාගැනීමක් සිදු කර නොතිබුණි. |
| (ආ) 1988 ප්‍රදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | 297,120,250 | සභාව සතු සියලු ඉඩම් ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් හෝ පරීක්ෂා කිරීමකට ලක් කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| මුදල් රෙගුලාසි 1647(ආ) | | සභාව සතුව පවතින වාහන හා ඒවායේ උපකරණ පිළිබඳව සම්පූර්ණ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ඇ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 වගන්තිය | | සභා වාහනවල ඉන්ධන දැවීම් පරීක්ෂා කර නොතිබුණි. |

2. <u>මූල්‍ය සමාලෝචනය</u>

2:1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,627,951 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.6,692,354 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

2:2:2 ඇස්තමේන්තුගත ආදායම් , බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර්31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) වරිපනම් හා බදු | 2,468,245 | 2,255,986 | 2,595,487 | 263,712 | 2,515,374 | 2,288,901 | 2,608,796 | 547,615 |
| (ii) කුලී | 5,457,000 | 3,180,313 | 4,345,591 | 249,638 | 6,163,700 | 4,360,899 | 4,887,531 | 249,638 |
| (iii) බලපත්‍ර ගාස්තු | 250,000 | 155,203 | 204,500 | - | 250,000 | 193,550 | 261,550 | - |
| (iv)වෙනත් ආදායම් | 11,193,000 | 7,071,697 | 4,000,486 | 13,927,229 | 12,980,000 | 8,067,390 | 6,958,379 | 9,657,215 |

2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය

සමාලෝචිත වර්ෂය ආරම්භයට සභාවේ සමස්ථ හිඟ ආදායම රු.10,454,468 ක් වූ අතර වර්ෂය තුළ බිල් කිරීම් රු.12,663,199 ක් විය. වර්ෂය තුළ ලැබීම්, කපාහැරීම් හා ගැලපුම් රු.8,677,088 ක් වූ අතර සමස්ථ ආදායම් හිඟය රු.14,440,579 ක් විය.

2.2.3 **වරිපනම් හා බදු**

(අ) **වරිපනම්**

i. සමාලෝචිත වර්ෂය සඳහා වරිපනම් බිල් කිරීම රු.1,018,277 ක් වූ අතර වර්ෂය තුළදී ඉන් රු.899,608 ක් හෙවත් සියයට 88 ක් පමණක් අයකරගෙන තිබුණි.

ii. සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ ශේෂය වූ රු.493,536 න් රු.410,166 ක් හෙවත් සියයට 83 ක් පමණක් අයකර තිබූ අතර වර්ෂය අවසානයට මුළු හිඟය රු.202,040 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ සමස්ථ වරිපනම් බදු අයකිරීමේ ප්‍රගතිය සියයට 87 ක අගයක් ගෙන තිබුණි.

iii. සමාලෝචිත වර්ෂය අවසානයට හිඟහිටි වරිපනම් සඳහා කාල විශ්ලේෂණයක් ඉදිරිපත් නොකෙරිණි.

(ආ) අක්කර බදු

i. සමාලෝචිත වර්ෂය සඳහා අක්කර බදු බිල්කිරීම රු.140,609 ක් වූ අතර , ඉන් රු.99,243 ක් හෙවත් සියයට 71 ක් පමණක් අයකරගෙන තිබුණි.

ii. සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ ශේෂය වූ රු.52,364 න් රු.39,589 ක් හෙවත් සියයට 76 ක් පමණක් අයකර තිබූ අතර, වර්ෂය අවසානයට මුළු හිඟය රු.54,141 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ සමස්ථ අක්කර බදු අයකිරීමේ ප්‍රගතිය සියයට 72 ක් පමණ විය.

2.2.4 වෙනත් ආදායම්

(අ) **දැන්වීම් පුවරු ආදායම්**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2015 නොවැම්බර් මස 06 දිනැති අංක 1940 දරන ගැසට් පත්‍රයේ පළකර ඇති ආකාරයට සහා බල ප්‍රදේශයේ සවිකර ඇති ඇන්වීම් පුවරු/ ප්‍රචාරක දැන්වීම් මගින් ගාස්තු අයකර ගැනීමට අදාළව සභාව විසින් 2017 වර්ෂයට සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(ආ) <u>රථවාහන නවතා තැබීමේ ගාස්තු</u>

සභා බල ප්‍රදේශයේ ත්‍රීරෝද රථ නවතාතැබීමේ ස්ථානවල නවතා තබන ත්‍රීරෝද රථ ලියාපදිංචි කරවාගෙන ගාස්තු අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

2.2.5 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.900,000 ක් හා මුද්දර ගාස්තු රු.13,000,000 ක් විය.

3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3:1 <u>කාර්ය සාධනය</u>

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය , පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරිම , ජනතාවගේ සුබ විහරණය , පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරිම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) <u>අතුරු ව්‍යවස්ථා</u>

ප්‍රාදේශිය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 16 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබු නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 12 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා ගෙන නොතිබුණි.

(ආ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේදී සභාව දැනුවත්වී නොතිබුණි.

3:2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

(අ) අගලවත්ත ප්‍රාදේශීය සභාව 2006 අප්‍රේල් 15 දින සිට පාලින්දනුවර හා අගලවත්ත යනුවෙන් ප්‍රාදේශීය සභා දෙකකට වෙන් වී තිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස පාලින්දනුවර ප්‍රාදේශීය සභාවට හිමි විය යුතු වත්කම් හා වගකීම් බෙදා වෙන්කර ගැනීමට 2018 ජුලි 31 වන විටත් සිදු කර නොතිබුණි.

(ආ) සභා බලප්‍රදේශයේ පවතින වීථි පහන් කණු නිවැරදිව හඳුනාගත හැකි වන පරිදි අංක කර පවත්වා ගැනීමට හෝ නිවැරදිව යාවත්කාලින කළ ලේඛනයක් පවත්වා ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඇ) 2017 වර්ෂය වෙනුවෙන් ඉරුදින ඌරු මස් විකිණීමේ ස්ථානයේ බදුකරු දිගින් දිගටම බදු මුදල් ගෙවීම පැහැර හැරීම නිසා ගිවිසුම අනුව රු.84,060 ක දඩ මුදලක් ලැබිය යුතුව තිබුණු අතර මෙම දඩ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සභා බලප්‍රදේශය තුළ පවත්නා කර්මාන්ත බදු ගෙවිය යුතු කර්මාන්ත හඳුනාගැනීමට අදාළව නිවැරදි සමීක්ෂණයක් සිදු කර නොතිබුණි.

(ඉ) 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන ගැසට් නිවේදනය මගින් නිකුත් කරන ලද මධ්‍යම පරිසර අධිකාරිය මගින් පළාත් පාලන ආයතනවලට බලතල පවරාදීම හා බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳ උපදෙස් මාලාවේ පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාපරිපාටිය ප්‍රකාරව සභාව විසින් පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කළයුතු වුවත් , 2017 වසරේ පවත්වාගෙන ගොස් තිබූ බොහෝ කර්මාන්ත වෙනුවෙන් පරිසර ආරක්ෂණ බලපත්‍රයක් නිකුත් කිරීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ඊ) පළාත් පාලන ආයතන ප්‍රදාන යටතේ සභාවට ලැබී තිබූ ජෙනරේටරයේ බැටරිය 2016 මාර්තු 31 දින අස්ථාන ගතවී තිබූ අතර, ඒ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් නොපවත්වා අදාළ දින රාජකාරියේ නිරතව සිටි මුරකරුගෙන් රු.19,375 ක් අයකර ගෙන තිබුණි.

(උ) වීථි පහන් කණු සඳහා අවශ්‍ය ප්‍රතිදීප්ත බල්බ හා අනෙකුත් උපාංග ගබඩාවෙන් අදාළ අංශයට නිකුත් කර තිබූ අතර, ගලවා ඉවත් කරනු ලබන බල්බ නිවැරදි ක්‍රමවේදයක් අනුගමනය කරමින් නැවත ගබඩාවට භාර ගැනීම හෝ භාරදීම සිදු කර නොතිබුණි. තවද සභාව විසින් ලබාගන්නා ප්‍රතිදීප්ත බල්බ සඳහා සාමාන්‍යයෙන් වසරක වගකීම් කාලයක් ඇතත් ගලවා ඉවත් කරන බල්බ වලට අදාළව මෙම වගකීම් කාලය සභාව විසින් නිවැරදිව හඳුනාගැනීමේ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

(ඌ) ඉන්වෙන්ට්‍රි ලේඛනය නිසි අධීක්ෂණයකින් තොරව පවත්වාගෙන ගොස් තිබූ අතර සෑම වර්ෂයකම අවසාන දිනට මෙම ලේඛනය තුලනය කරමින් ශේෂය ඉදිරියට ගෙන නොතිබුණි.

3:3 <u>මානව සම්පත් කළමනාකරණය</u>

<u>සේවක පුරප්පාඩු හා අතිරික්ත</u>

(අ) පුරප්පාඩුව ඇති ලේකම් තනතුරේ රාජකාරි ආවරණය කිරීම සඳහා කළමනාකරණ සහකාර පළමු පන්තියේ නිලධාරිනියක පත්කර තිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ කාර්යය මණ්ඩල විස්තරය අනුව සභාවේ සංවර්ධන නිලධාරි තනතුරක, පුස්තකාලයාධිපති තනතුරක, ආදායම් පරීක්ෂක තනතුරක හා වැඩ පරීක්ෂක තනතුරක පුරප්පාඩු පැවති අතර කළමනාකරණ සහකාර තනතුරක අතිරික්තයක් පැවතුණි.

(ඇ) වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් ලෙස සේවකයින් 20 දෙනෙකු හා සෞඛ්‍ය කම්කරුවන් ලෙස සේවකයින් 14 දෙනෙකු බඳවාගෙන තිබූ නමුත් වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් 11 දෙනෙකු හා සෞඛ්‍ය කම්කරුවන් 06 දෙනෙකු පමණක් ක්ෂේත්‍ර රාජකාරිවල නිරත වී සිටි බව නිරීක්ෂණය විය.

3.4 <u>වත්කම් කළමනාකරණය</u>

3.4.1 <u>වත්කම් ලේඛනගත නොකිරීම</u>

සභාවට අයත් මාර්ග නිවැරදිව හඳුනාගෙන ඒවා ලේඛනයකට ඇතුළත් කිරීමට හා ගැසට් කිරීමට අදාළව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

3.4.2 <u>වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම</u>

(අ) සභාව සතු සභා කාර්යාල හා මහජන පුස්තකාලය සහිත භූමියේ පිටුපස පර්චස් 10 ක පමණ භූමි ප්‍රමාණයක අනවසර පුද්ගලයකු වසර ගණනාවක සිට පදිංචි වී සිටින අතර මෙම පුද්ගලයා එම ස්ථානයෙන් ඉවත් කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) 2014 නොවැම්බර් මාසයේ දිවි නැගුම දෙපාර්තමේන්තුව මගින් GI බට 720 ක් ලබා දී තිබූ අතර එම බට වලින් වලල්ලාවිට හා අගලවත්ත ප්‍රාදේශීය සභාවලට පිළිවෙලින් GI බට 210 ක් හා 128 ක් ලෙස එකතුව බට 338 ක් ලබාදී තිබුණි. මෙම බට ලැබීම් හා නිකුත් කිරීම් පිළිබඳව තොග පොත්වල සටහන් කර නොතිබූ අතර , ලැබීම් සම්බන්ධයෙන් භාණ්ඩ ලැබීම් තුණ්ඩුවක් (GRN) නිකුත් කර තිබුණි. මෙම බට වලින් බට 118 ක් සභාවේ පැවති අතර , අස්ථාන ගතවූ බට 264 සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.තවද ඉතිරි බට 118 ක ප්‍රමාණය තොග පොත් වල සටහන් කිරීමට හෝ ප්‍රමාණවත් පරිදි ආරක්ෂාවක් සැපයීමට පියවර නොගැනීම මත භෞතිකව පැවතියේ බට 98 ක් බැවින් තවත් බට 20 ක් අස්ථාන ගතවී තිබුණි.

3.4.3 <u>පවරා නොගත් වත්කම්</u>

සභා බල ප්‍රදේශය තුළ පවතින සුසාන භූමි 32 න් 02 ක් පමණක් සභාව සතුව තිබූ අතර ඉතිරි සුසාන භූමි 30 පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.4.4 <u>කොන්ත්‍රාත් පරිපාලනය</u>

(අ) <u>ලබුදොල මාර්ගය සංවර්ධනය කිරීම</u>

සභාව විසින් රු.1,299,622 ක් වැයකර මීටර් 87 ක් හා 133 ක් වූ කොටස් 02 ක් යටතේ මෙම මාර්ගය සංවර්ධනය කර තිබූ නමුත් මාර්ගයේ මීටර් 87 ක් වූ පළමු කොටස නියමිත ප්‍රමිතීන්ට අනුකූලව ඉටුකර නොතිබුණි.

(ආ) <u>සභාවට අයත් පැරණි පුස්තකාල ගොඩනැගිල්ල නවීකරණය කිරීම</u>

අවුරුදු 40 කට වඩා පැරණි මෙම ගොඩනැගිල්ලේ ටයිල් ඇතිරීම හා වහලයට සිවිලිම ගැසීම වෙනුවෙන් සභාව විසින් රු.4,267,292 ක වියදමක් දරා තිබුණි. කෙසේ වුවද මෙවැනි වියදමක් දැරීමට පෙර මෙම ගොඩනැගිල්ලේ ශක්තිමත් භාවය පිළිබඳ තෙවන පාර්ශවයක් මගින් යෝග්‍යතාවය පිළිබඳව සහතිකයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබූ අතර ගොඩනැගිල්ලේ වහලය මැදින් ගිලා බැස ඇති අයුරු හා තැනින් තැන බිත්තිවල පිපුරුම් සලකුණු භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

4. **<u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>**

4.1 **<u>අයවැය පාලනය</u>**

සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත හා තථ්‍ය ආදායම්වල සියයට 10 සිට සියයට 35 දක්වාත් , වියදම්වල සියයට 12 සිට සියයට 88 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූ හෙයින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

4.2 <u>පළාත් ගිණුම් කාරක සභාවේ තීරණ ක්‍රියාත්මක නොකිරීම</u>

2018 ජනවාරි 04 හා 11 යන දිනවල පැවති පළාත් රාජ්‍ය ගිණුම්කාරක සභාව විසින් 2011 විගණකාධිපති වාර්තාවේ 1.2 (ඈ), 1.3.3(i), 1.3.3 (vi), 1.5 , 1.6(ii) , 2012 විගණකාධිපති වාර්තාවේ 2.1.1 (ඇ), 2.2 (ආ)(i), 2.2.4(ආ) (ii) සහ 2013 විගණකාධිපති වාර්තාවේ 1.2.2(ආ), 1.3.2 යන ඡේද සම්බන්ධයෙන් දී තිබූ නියෝග 2018 ජුලි 15 දිනටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

5. **<u>පද්ධති හා පාලන</u>**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| <u>පද්ධතිය</u> | | <u>අඩුපාඩුව</u> |
|---|---|---|
| (අ) ගිණුම්කරණය | i | ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබීම |
| (ආ) ආදායම් පාලනය | i | හිඟ ආදායම් අය නොවීම |
| | ii | දැන්වීම් පුවරු , බලපත්‍ර ගාස්තු ආදී ආදායම් නිවැරදිව හඳුනාගැනීමට අදාළ විධිමත් සමීක්ෂණ නොපැවැත්වීම |
| (ඇ) ගබඩා පාලනය | i | ලේඛන විධිමත් පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබීම |
| | ii | වාහන වලින් ගලවා ඉවත් කරන ලද කොටස් සම්බන්ධයෙන් නිසි ලේඛනයක් නඩත්තු නොකිරීම |

| | | |
|---|---|---|
| (ඇ)සේවක කළමනාකරණය | i | නිවැරදි ක්‍රමවේදයක් යටතේ මාර්ග හා ක්ෂේත්‍ර කම්කරුවන් සේවයේ නොයෙදවීම |
| | ii | සේවකයින්ගේ රාජකාරි අධීක්ෂණය දුර්වල මට්ටමක පැවතීම |
| (ඉ) අයවැය පාලනය | i | අයවැය ගත හා තථ්‍ය වියදම් අතර විශාල විචලනයන් පැවතීම. |
| | ii | ආදායම් ඇස්තමේන්තු තාත්වික නොවීම. |